# සක්විති රජ පදවියකට කැමති ද එසේ නම් ගුණ දැන බුදු රජාණන් වහන්සේගේ සහ රහතන් වහන්සේලාගේ ස්ථූප පිළිසකර කරන්න

## සුධාපිණ්ඩිය ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 230 - 231)

සිද්ධාර්ථ බුදු රජාණන් වහන්සේගේ චෛත්‍යයෙහි පැළුනු තැන් හුනු යොදා ප්‍රතිසංස්කරණය කළ අයෙක් ඒ පිනෙන් කල්ප අනූහතරක් සුගතියේ ම ඉපදුණා. සක්විති රජ සම්පත් ලැබුවා. ගෞතම බුදු සසුනේ පැවිදි ව කෙලෙසුන් නසා උතුම් රහත් බව ලැබුවා.